# 09 රාහුල පොඩි හාමුදුරුවෝ

''සීයේ......! සීයේ......! අද අපට සීයාගෙන් කරුණු ටිකක් දැනගන්න තියෙනවා......'' හේරත් හාමි සීයා සමීපයට පැමිණි නිලිණිත්, ජයනිත්, කවිඳුත්, සවිඳුත් යන දරු දැරියෝ එක හඬින් පැවසූහ.

''හොඳයි...... හොඳයි...... මගේ දරුවනේ, ඔහොම වාඩිවෙලා මට කියන්නකෝ මොනවා ගැන ද දැනගන්න ඕනේ කියලා......''

''අපට දැනගන්න ඕනේ රාහුල පොඩි හාමුදුරුවෝ ගැනයි......'' නිලිනි පිළිතුරු දුන්නා ය.

''දරුවනේ, ඔය, රාහුල කුමාරයා කියලා කියන්නේ යශෝදරා දේවියගේත්, සිද්ධාර්ථ කුමාරයාගේත් එකම පුතා. සුද්ධෝදන රජ්ජුරුවන්ගේ මුණුපුරා.''

''සීයේ රාහුල කුමාරයාට ඒ නම ලැබුණු විදියත් අපට පහදලා දෙන්නකෝ......'' කවිඳු පුතා කීවේ ය.

''අන්න හොඳ ප්‍රශ්නයක් මගේ පුතා ඇහුවෙ, සිද්ධාර්ථ කුමාරයා, ඒ කියන්නේ අපේ සිදුහත් බෝසතාණන් සතර පෙර නිමිති දැකලා, ජීවිතය පිළිබඳ කළකිරීමෙන් හිටියා කියලා මේ දරුවෝ අහලා ඇති නේ? සිද්ධාර්ථ කුමාරයා ඇසළ පුරපසළොස්වක පෝය දවසක තමයි ගිහිගෙය අතැරලා ගියේ. ඒ කියන්නේ **'අභිනිෂ්ක්‍රමණය'** කළේ. අන්න එදා ම තමයි යශෝදරා දේවියට පුත් කුමරෙක් ලැබුණේ. ඉතින් මාළිගයෙන් පිටවෙලා යන්න තීරණය කරලා හිටි සිද්ධාර්ථ කුමාරයාට පුතකු උපන්නාය යන ආරංචිය ලද හැටියේ ම ඉබේටම කියවුණා,

**''රාහුලො ජාතො - බන්ධනං ජාතං''**

කියලා. ඒ කියන්නේ,

''රාහුලයෙක් උපන්නා, බැඳීමක් හටගත්තා'' කියලා.

ඉතින් එදා ඉඳලා ''රාහුල'' නමින් මේ කුමාරයා ප්‍රසිද්ධ වුණා කියලා සඳහන් වෙනවා.

''ඉතින් සීයේ, එදා මාළිගාවෙන් පිටවෙලා ගියාට පස්සේ සිද්ධාර්ථ කුමාරයා, පුංචි රාහුල කුමාරයා බලන්න මාළිගාවට ආවේ නැත්ද?......'' ජයනි දුව ප්‍රශ්නයක් මතු කළා ය.

''දරුවනේ, එදා මාළිගාවෙන් පිටවෙලා නේරංජනා ගංතෙරෙන් එගොඩ වුණ සිද්ධාර්ථ කුමාරයා අවුරුදු හයක් තිස්සෙ ම සිරුරට දැඩි දුක් දෙමින් සත්‍යය සෙව්වා. ඒත් එසේ දුෂ්කර ක්‍රියා කිරීමෙන් පළක් නැති බව වටහා ගත් සිද්ධාර්ථ කුමාරයා ''මධ්‍යම ප්‍රතිපදාව'' ඒ කියන්නේ ''ආර්ය අෂ්ටාංගික මාර්ගය'' අනුගමනය කරලා තමයි ලොව්තුරා බුද්ධත්වයට පත්වුණේ. මේ බව දැනගත් සුද්ධෝදන රජු මහත් සතුටට පත්වෙලා කිහිපවතාවක් ම උත්සාහ කළා බුදුරජාණන් වහන්සේව තමන්ගේ රාජ්‍යයට වැඩමවා ගන්න. අවසානයේ දී කලින් සුද්ධෝදන රජතුමාගේ ඇමතියෙකු වූ ''කාළුදායි'' හාමුදුරුවෝ තමයි බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුරයට, ඒ කියන්නේ කපිල වස්තු නුවරට වැඩමවාගෙන ආවේ......''

''සීයේ, මම අහලා තියෙනවා කිඹුල්වත් නුවරට වඩින ගමනේ දී, බුදුරජාණන් වහන්සේ සමග විසිදහසක් මහ සඟරුවන වැඩියා කියලා, ඒක ඇත්ත ද?'' කවිඳු පුතා ප්‍රශ්න කළේ ය.

''ඔව් පුතේ, බෞද්ධ සාහිත්‍යයේ එහෙම සඳහන් වෙනවා. ඒ විතරක් නෙවෙයි, වෙසක් පුන් පොහෝ දිනක, පා ගමනින් ම තමයි කිඹුල්වත් පුරයට මේ පිරිස ළඟා වන්නේ......''

''එතකොට සීයේ, බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් නුවරට වැඩම කරලා බොහෝ කලක් එහි වැඩ විසුවා ද? කොහොමද රාහුල කුමාරයා උන් වහන්සේට මුණ ගැහෙන්නේ......'' නිලිනි දුව ඇසුවා ය.

''දරුවනේ, මාළිගාවේ දානයට වඩින බුදුරජාණන් වහන්සේ දුටු යසෝදරා දේවිය සඳළුතලයේ සිට රාහුල කුමාරයාට නරසීහ ගාථාවලින් බුදුහාමුදුරුවන්ගේ මහා පුරුෂ ලක්ෂණත්, මහා බුද්ධානුභාවයත් විස්තර

කොට, ''පුතේ, අර විසිදහසක් භික්ෂූන් වහන්සේ පිරිවරා රත් පැහැයෙන් බබළමින් මහ මග වඩින්නේ ඔබේ පියා යි. එතුමන්ගෙන් දායාද ඉල්ලාගෙන එන්නැයි'' තම පුතු පිටත් කොට හැරියා. කුමාරයාත් දිවගොස් බුදුරජාණන් වහන්සේගේ අතේ එල්ලී දායාද ඉල්ලමින් විහාරයට ම ගියා......''

''ආනේ......! සීයේ ඉතින්, බුදුරජාණන් වහන්සේ රාහුල කුමාරයාට දායාද දුන්නා ද?'' යි ජයනි දුව කුතුහලයෙන් යුතුව ඇසුවා ය.

''ඔව්, ඔව්, දුවේ, බුදුරජාණන් වහන්සේට දෙන්න පුළුවන් ලොකු ම දායාදය උන්වහන්සේ රාහුල කුමාරයාට දුන්නා...... ඒ තමයි පැවිද්ද......!''

''එතකොට සීයේ, බුදුරජාණන් වහන්සේ අතින් ම ද රාහුල කුමාරයා පැවිද්ද ලැබුවේ......?'' සවිඳු පුතා ඇසුවේ ය.

''නැහැ, නැහැ...... පුංචි රාහුල කුමාරයාගේ හිසකෙස් ගාලා, කසාවත් හැන්දවූයේ සැරියුත් මහරහතන් වහන්සේ, රාහුල පොඩි හාමුදුරුවන්ගේ උපාධ්‍යායන් වහන්සේ බවට පත්වූයේ සැරියුත් මහරහතන් වහන්සේ යි. ආචාර්යවරයන් වහන්සේ බවට පත්වූයේ මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ යි......''

ඒ තමයි බුද්ධ ශාසනයේ ළමයෙකු මහණ කළ පළමු වතාව. ඒ වගේ ම ශ්‍රාවකයන් වහන්සේලාට අනුන් මහණ කරන්න අවසර ලැබුණෙත් එදා තමයි. තිසරණ සමාදන් කරවීමෙනුයි ඒ මහණකම සිදු වුණෙත්.

''සීයේ රාහුල පොඩි හාමුදුරුවෝ, තමන්ගේ ගුරු හාමුදුරුවන් වහන්සේලාට ගොඩාක් ගරු කළා ලු නේද?.......'' නිලිනි දුව ඇසුවා ය.

''ඔව්, දරුවනේ සියලු වැඩිහිටි හාමුදුරුවන් වහන්සේලාට උන්වහන්සේ එක සේ ගරු කළා. ඒ විතරක් ද? මනා ලෙස හික්මීමෙන් යුක්ත වුණා. බුදුරජාණන් වහන්සේ තම පියාණන් වූවා කියා කිසිදු අහංකාර කමක් ඇති කරගත්තේ නෑ. හරිම නිහතමානියි. හොඳ ඉවසීමෙනුත් කටයුතු කළා. මං කියන්නම් අපූරු කතාවක්''

රාහුල පොඩි හාමුදුරුවන්ගෙ නිහතමානි කම බලන්න හාමුදුරුවරු පොඩි හාමුදුරුවො අතුගෑ මිදුලට ආයෙත් කුණු ගෙනත් දමනවා. අනේ, රාහුල පොඩිහාමුදුරුවො කිසි කතාවක් නැතුව සිනාමුසු මුහුණින් ආයෙත් අතුගාල කුණු අරන් දමනවා.

ඇයි සීයෙ, අර වැසිකිළියෙ රෑ ගත කරපු කතාව? ජයනි ඇසුවා ය.

ඔව්, ඔව්, දුවේ. බුදුහාමුදුරුවෝ උපසම්පදා හාමුදුරුවරුන්ට සාමණේර හාමුදුරුවරුන් සමග එක වහලයක් යට රැයක් ගත කිරීම තහනම් කරල නීතියක් පණවල තිබුණා.

දවසක් රාහුල පොඩි හාමුදුරුවෝ ජේතවනාරාමයට ගියා. බුදුහාමුදුරුවන් වහන්සේට වඳින්න. අර නීතිය නිසා හාමුදුරුවරු කවුරුවත් රාහුල පොඩි හාමුදුරුවන්ට ආවාසෙ ඉන්න දුන්නේ නැහැ. රාහුල පොඩි හාමුදුරුවෝ කිසි කතාවක් නැතුව බුදුහාමුදුරුවන්ගේ වැසිකිළියෙ රැය ගත කළා. පසුව මේක දැන ගෙන බුදුහාමුදුරුවෝ ඒ නීතිය වෙනස් කරලා රැයක් දෙකක් ගත කරන්න අවසර දුන්නා.

අනේ පව්! ඒ වගේ ම රාහුල හාමුදුරුවෝ අවවාද ලබන්න ආසයි කියලත් මම අහලා තියෙනවා.'' සචිඳු පුතා කීවේ ය.

''අන්න හරි, දරුවනේ මේ රාහුල පොඩි හාමුදුරුවෝ දිනපතා ම උදෙන් ම අවදි වී මළු පෙත් අමදිනවා. ඒ වගේ ම වැලි දෝතක් උඩ දමා ''අද දින මට මේ වැලිකැට ගණනට අවවාද ලැබේවා!'' යි ප්‍රාර්ථනා කරනවා. බලන්න, මේ දූලා පුතාලටත් කොච්චර ආදර්ශ ගන්න පුළුවන් ද, රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිතයෙන්......''

''ඔව් සීයේ, ඒක නම් ඇත්ත, මේ ගතිගුණ නිසා ම නේ ද රාහුල පොඩි හාමුදුරුවෝ ශික්ෂාකාමීන් අතර අග තැන්පත් වෙන්නේ......'' සචිඳු පුතා ඇසුවේ ය.

''ඔව් පුතේ, ළපටි වයසේ සිටි රාහුල පොඩි හාමුදුරුවන්ට, දවසක් අප ලොව්තුරා සම්බුදුරජාණන් වහන්සේ අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය දේශනා කළා. ඒ සූත්‍රයේ තියෙන්නේ බොරුකීමේ ආදීනව. බුදුරජාණන්වහන්සේ

තමන්ට පා සෝදන්න ගෙනා වතුර භාජනය මුනින් නවා පෙන්වලා, ''රාහුල, දැන් මේ භාජනය හිස් වගේ ම දැන දැන බොරු කියන ලැජ්ජ නැති කෙනාගේ මහණකමත් හිස් '' යැයි දේශනා කළා. ඒ වගේ ම සටන් බිමට යන ඇතෙක් නිතර ම සටන් කරන්නෙ සොඬය සඟවාගෙන යි. ඌ සොඬෙන් පහර දෙන්නෙ ජීවිතාශාව අත්හැරියාම යි. අන්න ඒ වගේ කෙනෙකුට දැන දැන බොරු කීමෙන් ලැජ්ජාවක් නැති නම් ඔහුට කරන්න බැරි පවක් නැහැ. ඒ නිසා විහිළුවටවත් බොරුවක් නොකියන්නැ'යි ඒ සූත්‍රයේදී රාහුල හාමුදුරුවන්ට අවවාද කළා. ඊළඟට තරුණ වයසට එන විට තරුණ මදය නැති වෙන්න මහාරාහුලෝවාද සූත්‍රය දේශනා කළා. චූල්ලරාහුලෝවාද සූත්‍රය අහලා තමයි රාහුල හාමුදුරුවන් වහන්සේ රහත් භාවයට පත්වන්නේ. පසුව තමයි ශික්ෂාකාමී භික්ෂූන් වහන්සේලා අතර අගතැන්පත් වන්නේ......''

''සීයේ, ඒ වුණාට රාහුල කුමාරය පැවිදි කළායින් පස්සේ, යශෝදරා දේවියටයි, සුද්ධෝදන රජතුමාටයි ගොඩාක් දුක හිතෙන්න ඇති නේද?......'' නිලිනි ඇසුවාය.

''අන්න, මගේ දුව, හොඳ ප්‍රශ්නයක් ඇහුවේ......'' සිද්ධාර්ථ කුමාරයා මාළිගයෙන් පිටවෙලා ගියාට පස්සේ කණස්සල්ලෙන් හිටපු සුද්ධෝදන රජතුමා මඳක්වත් සිතට සහනයක් ලබාගත්තේ රාහුල කුමාරයා නිසා. යසෝදරා දේවියත් එහෙම යි. ඉතින්, පුංචි රාහුල කුමාරයා පැවිදි කළායින් පස්සේ සුද්ධෝදන රජතුමා ඉතා අසරණ වුණා. රජතුමා බුදුරජාණන් වහන්සේ සමීපයට ඇවිල්ලා කාරුණික ඉල්ලීමකුත් කළා, දෙමාපිය අවසරයක් නැතිව කුල කුමරුවන් පැවිදි නොකරන ලෙසට. බුදුරජාණන් වහන්සේ ඒ ඉල්ලීම පිළිගත්තා...... හොඳයි, දැන් මේ දරුවන්ට රාහුල කුමාරයා ගැනත් රාහුල පොඩි හාමුදුරුවෝ ගැනත් කරුණු ගොඩාක් දැනගන්න ලැබුණා නේ, මේ දරුවනුත් රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිතයෙන් උතුම් ගුණ ධර්ම ආදර්ශයට ගන්න. මේ දරුවන් ට උතුම් ත්‍රිවිධ රත්නයේ සරණයි!'' හේරත් හාමි සීයා දරුවන්ට කරුණු කියා දීම අවසන් කළේ ය.

හැමෝ ම සීයාගේ දෙපා නැමද සමුගත්තේ හද පිරි සතුටිනි.

## ක්‍රියාකාරකම 9.1

1. රාහුල පොඩි හාමුදුරුවන් පිළිබඳව කියැවෙන කවියක් නිර්මාණය කරන්න.
2. රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිතයෙන් අපට ලද හැකි ආදර්ශ කිහිපයක් ලියා දක්වන්න.
3. රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිත කතාවේ ඔබ සිත් ගත් තැනක් චිත්‍රයට නගන්න.

## ක්‍රියාකාරකම 9.2

දී ඇති උපකාරක පද ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රහේලිකාව පුරවන්න.

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 අ | | | | | 2 ම | | | ■ | 3 වි | | |
| | ■ | ■ | ■ | ■ | | ■ | ■ | ■ | | ■ | ■ |
| | ■ | ■ | ■ | 4 කි | ■ | ■ | 5 දා | | | ■ | 6 සැ |
| | ■ | ■ | ■ | | ■ | ■ | ■ | ■ | | ■ | |
| | ■ | ■ | 7 සි | | | | ■ | ■ | | ■ | |
| | ■ | ■ | ■ | | ■ | ■ | ■ | ■ | | ■ | |
| ක | ■ | ■ | ■ | | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ |

**හරහට :**

1. බෝසතුන් ගිහිගෙය අතහැර යාම මෙ නමින් හැඳින්වේ.
3. පැවිදි වූ තැන් සිට රාහුල පොඩි හාමුදුරුවෝ මෙය ගරු කළ බව කියැවේ.
5. කුඩා රාහුල පුතු බුදුරදුන් පසු පස ගියේ මෙය ඉල්ලා ගැනීමට ය.
7. රාහුල හිමියන් අගතැන්පත් වූයේ මේ ගුණයටයි.

පහළට :

1. බුදුරජාණන් වහන්සේ රාහුල හිමියන් උදෙසා දේශනා කරන ලද සූත්‍රයකි.
2. බුදුරජාණන් වහන්සේ තුළ පැවති කරුණාව හැඳින්වීමට මෙම විශේෂණය ද මුලට යොදයි.
3. බුදුරදුන් කිඹුල්වත් පුරට වැඩියේ භික්ෂූන් වහන්සේ මෙපමණක් පිරිවරාගෙන ය.
4. කපිල වස්තුව හඳුන්වන තවත් නමකි.
6. රාහුල හාමුදුරුවන්ගේ උපාධ්‍යායන් වහන්සේ.

**ජීවිතයට ඔවදනක්**

"න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධිමත්තනො"

අධර්මයෙන් තමන්ගේ වැඩිදියුණුව නොපතනු මැනවි.